# ශ්‍රී ලංකා
# ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ
# පාර්ලිමේන්තුව

---

## ශ්‍රී ලංකා හිරා පදනම (සංස්ථාගත කිරීමේ)

**ශ්‍රී ලංකා හිරා පදනම සංස්ථාගත කිරීම සඳහා වූ පනත් කෙටුම්පතකි.**

---

වන්නි දිස්ත්‍රික් පාර්ලිමේන්තු මන්ත්‍රී ගරු කේ. කාදර් මස්තාන් මහතා විසින්
2015 දෙසැම්බර් මස 02 වන දින ඉදිරිපත් කරන ලදී.

(ගැසට් පත්‍රයේ පළ කළේ 2015 නොවැම්බර් මස 02 වන දින)

මුද්‍රණය කිරීමට පාර්ලිමේන්තුව විසින් නියෝග කරන ලදී

---

[32 වන පනත් කෙටුම්පත]

ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.
කොළඹ 5, රජයේ ප්‍රකාශන කාර්යාංශයෙන් මිළදී ලබාගත හැකිය.

**මිළ : රු. 8.00 යි.** **තැපැල් ගාස්තුව : රු. 10.00 යි.**

ශ්‍රී ලංකා හිරා පදනම (සංස්ථාගත කිරීමේ)

## ශ්‍රී ලංකා හිරා පදනම සංස්ථාගත කිරීම සඳහා වූ පනතකි

"ශ්‍රී ලංකා හිරා පදනම " යනුවෙන් සඳහන් කරනු ලබන පදනමක්, එකී පදනමේ සාමාජිකයන් එකඟ වූ රීති අනුව ඒ පදනමේ පරමාර්ථ හා ඊට අදාළ කාරණා එලදායී ලෙස ක්‍රියාවේ යෙදවීමේ කාර්යය සඳහා මෙතෙක් කල් පිහිටුවා තිබූ අංක 10/18, ලේක් ඩ්‍රයිව්, කොළඹ 08. පිහිටුවා තිබූ හෙයින් ද :

පූර්විකාව.

එකී පදනම පිහිටුවනු ලැබුවේ යම් පරමාර්ථ සහ කරුණු සඳහා ද ඒ පරමාර්ථ සහ කරුණු මෙතෙක් කල් එකී පදනම විසින් සාර්ථකව ක්‍රියාත්මක කර සහ ඉටු කර ඇති හෙයින් සහ එකී පදනම සංස්ථාගත කරන ලෙස ඉල්ලා ඇති හෙයින් ද:

ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ පාර්ලිමේන්තුව විසින් මෙසේ පනවනු ලැබේ :—

**1.** මේ පනත 2015 අංක    දරන "ශ්‍රී ලංකා හිරා පදනම" (සංස්ථාගත කිරීමේ) පනත යනුවෙන් හඳුන්වනු ලැබේ.

ලුහුඬු නාමය.

**2.** මෙම පනත ක්‍රියාත්මක වීම ආරම්භ වන දින සිට සහ ඉන් පසුව (මෙහි මින් මතු "පදනම" යනුවෙන් සඳහන් කරනු ලබන) ශ්‍රී ලංකා හිරා පදනමේ දැනට සාමාජිකයන්ව සිටින තැනැත්තන් සහ මෙයින් සංස්ථාපනය කරනු ලබන සංස්ථාවට මින් මතු බඳවා ගනු ලබන තැනැත්තන් (මෙහි මින් මතු "සංස්ථාව" කිරීම යනුවෙන් හඳුන්වනු ලබන ශ්‍රී ලංකා හිරා පදනම යන නාමය සහ අභිධානය යටතේ අවිච්ඡින්න පැවැත්මක් ඇති සංස්ථාවක් විය යුතු ය. තව ද ඒ නාමයෙන් ඒ සංස්ථාව විසින් ද, එයට විරුද්ධව ද සියලු අධිකරණවලදී නඩු පවරනු ලැබිය හැකි අතර, පොදු මුද්‍රාවක් තබා ගැනීමේ, එය පාවිච්චි කිරීමේ, ස්වකීය අභිමතය පරිදි එය වෙනස් කිරීමේ පූර්ණ බලය හා අධිකාරය ඒ සංස්ථාවට ඇත්තේ ය.

හිරා පදනම සංස්ථාගත කිරීම.

**3.** සංස්ථාව සංස්ථාපනය කරනු ලබන්නේ කවර පොදු පරමාර්ථ සඳහා ද ඒ පරමාර්ථ පහත දැක්වෙන පරිදි විය යුතු යයි මෙයින් ප්‍රකාශ කරනු ලැබේ:—

සංස්ථාවේ පොදු පරමාර්ථ.

(අ) කාන්තාවන් හා ළමුන්ගේ සියලුම අයිතීන් ප්‍රවර්ධනය කිරීම හා වැඩිදියුණු කිරීම සඳහා ක්‍රියා කිරීම ;

(ආ) හදිසි ආපදාවල වින්දිතයන්ට සහාය දීම හා ඔවුන්ට තම ජීවන තත්ත්වය නගාසිටුවා ගැනීම සඳහා ආධාර ලබා දීම හා දිළිඳු තැනැත්තන්ට අවශ්‍ය අවස්ථාවන්හි නීති ආධාර හා නීති උපදෙස් ලබා දීම ;

(ඇ) ජනතාවගේ සදාචාරාත්මක හා සංස්කෘතික අගයන් සුරැකීමට හා ආරක්ෂා කිරීමට පියවර ගැනීම ;

(ඈ) ආගමික මධ්‍යස්ථාන සංවර්ධනය කිරීමේ ලා ආධාර හා උපදෙස් ලබා දීම ;

(ඉ) රට තුළ ජීවත්වන සියලුම ජාතීන්ට සමගියෙන් හා සහජීවනයෙන් ජීවත් වීමට අවශ්‍ය සියලු උපදෙස් හා ආධාර ලබා දීම ;

(ඊ) අඩු ආදායම්ලාභී පාසල් ශිෂ්‍ය ශිෂ්‍යාවන්ට සිය අධ්‍යාපන කටයුතු ඵලදායී ලෙස ඉටු කර ගැනීමට පහසුවන පරිදි පාසල්වලට භෞතික හා ගුණාත්මක වශයෙන් ආධාර හා අනුබල ලබා ගැනීම ;

(උ) විරැකියාවෙන් පෙළෙන තරුණ ප්‍රජාව ස්වයං රැකියාවලට යොමු කිරීමට අවශ්‍ය ආධාර හා අනුබලය ද පුහුණුව ද ලබා දීමට කටයුතු කිරීම ;

(ඌ) පාසලෙන් පිටවන දරුදැරියන් හට ඔවුන්ගේ කලාත්මක නිර්මාණ, ක්‍රීඩා කෞශල්‍ය හා කාර්මික දැනුම ප්‍රවර්ධනය කිරීමට අවශ්‍ය කටයුතු කිරීමත්, ඒ සඳහා වෘත්තීය පුහුණු මධ්‍යස්ථාන ඇති කිරීම, පරිගණක විද්‍යා හා නවීන තාක්ෂණය හැදෑරීම සඳහා ආධාර උපකාර කිරීම මෙන්ම එවැනි ආයතන ආරම්භ කිරීම;

(එ) ජාති, ආගම්, කුල බේදයෙන් තොරව අධ්‍යාපනික, ආගමික සංස්කෘතික, කලා හා ක්‍රීඩා පහසුකම් දියුණු කිරීම සඳහා ආධාර උපකාර කිරීම සහ විවිධ උත්සව හා තරග පැවැත්වීම ;

(ඒ) දුප්පත්, අනාථ සහ රෝගී තැනැත්තන්ට වෛද්‍ය සහන, ආහාර සැපයීම, මහලු අය හා අවතැන්වූ අය වෙනුවෙන් නිවාස පිහිටුවීම හා පවත්වාගෙන යාම, ළමා නිවාස පිහිටුවීම මෙන්ම ළමා වැඩිහිටි දිවා සුරැකුම් මධ්‍යස්ථාන පිහිටුවීම හා පවත්වාගෙන යාම ;

(ඔ) ඉහත දැක්වෙන පරමාර්ථවලට සමාන පරමාර්ථ ඇති දේශීය හා විදේශීය සංවිධාන සමග සහයෝගීව කටයුතු කිරීම.

සංස්ථාවේ කටයුතු කළමනාකරණය කිරීම.

**4.** (1) සංස්ථාවේ කටයුතු, මේ පනතේ අනෙකුත් විධිවිධානවලට සහ සංස්ථාවේ තත්කාලයේ පවත්නා රීතිවලට යටත්ව සහ එම රීතිවලට අනුකූලව තෝරා පත් කරනු ලබන සභාපති, මහලේකම්, මුදල් (අධ්‍යක්ෂ) නියෝජ්‍ය සභාපති, අධ්‍යක්ෂ (පාලන) සහ හය දෙනකුගෙන් සමන්විත අධ්‍යක්ෂ මණ්ඩලයක් මගින් කළමනාකරණය කරනු ලැබිය යුතු ය.

(2) සංස්ථාවේ ප්‍රථම අධ්‍යක්ෂ මණ්ඩලය මේ පනත ක්‍රියාත්මක වන දිනට පෙරාතුවම වූ දිනයේ දී පදනමේ පාලක මණ්ඩලයේ සාමාජිකත්වය දැරුවා වූ තැනැත්තන්ගෙන් සමන්විත විය යුතු ය. පදනමේ නිර්මාතෘවරයා වන ගරු අමාත්‍ය එම්. එල්. ඒ. හිස්බුල්ලාහ් මැතිතුමා ජීවත්ව සිටින කාලය තෙක් මෙම පදනමේ සේවය කරනු ලැබේ.

(3) සභාපතිවරයා හැර, අධ්‍යක්ෂ මණ්ඩලයේ සාමාජිකයකු මිය යාම හෝ ඉල්ලා අස්වීම නිසා කලින් ධුරය අත්හල හොත් මිස අවුරුදු හතරක කාලයක් සඳහා ධුරය දැරිය යුතු ය. මිය යාම හෝ ඉල්ලා අස්වීම නිසා අධ්‍යක්ෂ මණ්ඩලයේ පුරප්පාඩුවක් ඇතිවන අවස්ථාවක දී එම පුරප්පාඩුව පිරවීම සඳහා නව සාමාජිකයකු පත්කළ යුතු අතර, එම නව සාමාජිකයා අවුරුදු හතරක් ධුර දැරිය යුතු ය.

සංස්ථාවේ සාමාන්‍ය බලතල.

**5.** බැංකු ගිණුම් විවෘත කිරීමේ, පවත්වාගෙන යාමේ හා වැසීමේ ද ඇප ඇතිව හෝ නැතිව මුදල් ණයට ගැනීමේ හෝ ලබා ගැනීමේ ද, ප්‍රදානයන් හා පරිත්‍යාග භාර ගැනීමේ සහ එකතු කිරීමේ ද, සංස්ථාවේ මුදල් ආයෝජනය කිරීමේ ද, සංස්ථාවේ පරමාර්ථ ඉටු කර ගැනීම සඳහා අවශ්‍ය නිලධරයන් සහ සේවකයන් සේවයට බඳවා ගැනීමේ, සේවයේ නියුක්ත කිරීමේ, සේවයෙන් පහකිරීමේ ද බලය ඇතුළුව, සංස්ථාවේ සියලුම පරමාර්ථ හෝ එහි යම් පරමාර්ථයක් ප්‍රවර්ධනය කිරීම හෝ සාක්ෂාත් කර ගැනීම සඳහා අවශ්‍ය හෝ

යෝග්‍ය සියලු ක්‍රියා, කරුණු හෝ දේවල් කිරීමේ, ඉටු කිරීමේ සහ ක්‍රියාවේ යෙදවීමේ බලය මේ පනතේ සහ වෙනත් යම් ලිඛිත නීතියක විධිවිධානවලට යටත් ව සංස්ථාවට ඇත්තේ ය.

පදනමේ රීති.

**6.** (1) පදනමේ රැස්වීම්වල දී අනුගමනය කළ යුතු කාර්ය පටිපාටිය සහ පදනමේ රැස්වීම්වල ගණපූරණය ඇතුළු පහත දැක්වෙන සියලුම කරුණු හෝ ඉන් කිසිවක් හෝ සඳහා මේ පනතේ විධිවිධානවලට අනනුකූල නොවන රීති, පදනමේ සභා රැස්වීමක දී ඊට පැමිණ ඡන්දය දෙන සාමාජිකයන්ගේ බහුතර ඡන්දයෙන් කලින් කල භාරය විසින් සෑදීම නීත්‍යානුකූල වන්නේ ය :—

(අ) පදනමේ සාමාජිකයන් තෝරා පත් කර ගැනීම, පත් කිරීම හා ඉවත් කිරීම ;

(ආ) සාමාජිකයන් බඳවා ගැනීම, ඉවත් කර ගැනීම හෝ පහ කිරීම ;

(ඇ) මණ්ඩලයේ සහ එහි විවිධ නිලධාරීන්ගේ කාරක සභාවල සහ සේවකයන්ගේ යුතුකම් ඉටු කිරීම සඳහා ;

(ඈ) පදනමේ අරමුදල් පරිපාලනය කිරීමේ දී සහ එහි අරමුණු සාක්ෂාත් කර ගැනීමේ දී අනුගමනය කළ යුතු කාර්ය පටිපාටිය සඳහා ;

(2) මේ පනත ක්‍රියාත්මක වීම ඇරඹෙන දිනයේ දී බලාත්මක පදනමේ කිසිම රීතියක් හෝ (i) වන උපවගන්තියේ විස්තර කෙරෙන ආකාරයට මිස වෙනස් කිරීම, මින් මතු සෑදිය හැකි ඕනෑම රීතියක් හෝ ඊට යමක් කිරීම. සංශෝධනය කිරීම හෝ පරිච්ඡින්න කිරීම හෝ නොකරනු ලැබිය හැකි ය.

(3) මේ පනත ක්‍රියාත්මක වීම ආරම්භ වන දිනයට භාරයේ බලපැවැත්වූ සියලුම රීති භාරයේ රීති වශයෙන් සලකනු ලැබිය යුතු ය.

(4) පදනමේ සාමාජිකයන් පදනමේ රීතිවලට යටත් විය යුතු ය.

පදනම විසින් ගෙවනු ලැබිය යුතු ණය.

**7.** මේ පනත ක්‍රියාත්මක වීම ආරම්භ වන දිනයේ දී පැවති පදනම විසින් ගෙවිය යුතු ව තිබූ සියලු ණය සහ බැරකම් මෙයින් සංස්ථාපනය කරනු ලබන පදනම විසින් ගෙවිය යුතු අතර, එදිනට පදනමට අයවිය යුතුව තිබූ සියලු ණය සහ ලැබිය යුතු ව තිබූ සම්මාදම් මුදල්, ප්‍රදාන සහ දායක මුදල් මේ පනතේ කාර්ය සඳහා පදනමට ගෙවනු ලැබිය යුතු ය.

පදනමේ අරමුදල.

**8.** (1) පදනම එහිම අරමුදලක් තිබිය යුතු අතර, පදනම සඳහා සහ වෙනුවෙන් භාරගනු ලබන ත්‍යාග, රික්තවරණ පැවරීම්, පරිත්‍යාග, සම්මාදම් මුදල්, දායක මුදල්, ගාස්තු හෝ ප්‍රදාන පදනම විසින් තීරණය කරනු ලබන පරිදි බැංකුවක හෝ බැංකු වැඩි ගණනක සංස්ථාවේ බැරට තැන්පත් කරනු ලැබිය යුතු ය.

(2) මේ පනත යටතේ සංස්ථාව සතු බලතල, කාර්යය හා කර්තව්‍ය ක්‍රියාත්මක කිරීමේ දී, ඉටු කිරීමේ දී හා කිරීමේ දී පදනම විසින් වියදම් කරන ලද සියලුම මුදල් භාර අරමුදලින් ගෙවිය යුතු ය.

පදනම විසින් චංචල හෝ නිශ්චල දේපල දැරිය හැකි බව.

**9.** යම් මිලට ගැනීමකින්, ප්‍රදානයකින්, ත්‍යාගයකින්, තෙස්තමේන්තු බැහැර කිරීමකින් හෝ වෙනත් යම් ආකාරයකින් හෝ පදනම වෙත සතු කරනු ලබන යම් චංචල හෝ නිශ්චල දේපළක් අත්කර ගැනීමට සහ දැරීමට නීතියෙන් බලය හා හැකියාව ඇති අතර, එකී සියලු දේපල පදනම විසින් මේ පනතේ කාර්ය සඳහා දැරිය යුතු ය. තව ද පදනමේ තත්කාලයේ බලපවත්නා රීතිවලට යටත්ව එකී දේපළ විකිණීමේ, උකස් කිරීමේ, බද්දට දීමේ, හුවමාරු කිරීමේ හෝ අන්‍යාකාරයකින් බැහැර කිරීමේ පූර්ණ බලය ද පදනම සතු වන්නේ ය.

සාමාජිකයන්ගේ වගකීම සීමා කිරීම.

**10.** සංස්ථාවේ කිසිම සාමාජිකයකු සංස්ථාවේ ණය සහ බැරකම් ගෙවා සමථයකට පත් කිරීමේ කාර්යය සඳහා හෝ වෙනත් යම් කාර්යයක් සඳහා හෝ ඔහුගෙන් සංස්ථාවට අයවිය යුතු සාමාජික මුදල් ප්‍රමාණය ඉක්මවන යම් දායක මුදලක් ගෙවීමට යටත් නොවන්නේ ය.

පදනම විසුරුවා හැරීමේ දී ඉතිරිවන දේපල.

**11.** පදනම විසුරුවා හැරීමේ දී එහි සියලු ණය හා බැරකම් පියවීමෙන් පසු කවර හෝ දේපලක් ඉතිරි වුවහොත්, ඒ දේපල පදනමේ සාමාජිකයන් අතර බෙදනු නොලැබිය යුතු අතර, පදනමේ පරමාර්ථවලට සමාන පරමාර්ථ ඇත්තා වූ ද ස්වකීය රීති අනුව යම්

ආදායමක් හෝ දේපලක් ස්වකීය සාමාජිකයන් අතර බෙදා දීම තහනම් කරනු ලබන්නා වූ ද, වෙනත් යම් ආකාරයකට හෝ ආයතනවලට ඒ දේපල දීම හෝ පැවරීම කරනු ලැබිය යුතු ය.

ගිණුම් සහ විගණනය.

**12.** (1) පදනමට ලැබුණු සහ පදනම විසින් වියදම් කරනු ලැබූ සියලු මුදල් පිළිබඳව නිසි ගිණුම් පවත්වාගෙන යාමට පදනම විසින් කටයුතු සැලැස්විය යුතු ය.

(2) පදනමේ ගිණුම්, සෑම වර්ෂයකම යටත් පිරිසෙයින් එක් වරක් හෝ පරීක්ෂා කොට විගණනය කරනු ලැබිය යුතු අතර, පදනම විසින් පත් කරනු ලබන ශ්‍රී ලංකා වරලත් ගණකාධිකාරිවරුන්ගේ ආයතනයේ ආශ්‍රිත සාමාජිකයකු විය යුතු විගණකවරයෙක් හෝ විගණකවරයන් විසින් ආදායම් සහ වියදම් පිළිබඳ ගිණුම් සහ ශේෂ පත්‍රය සහතික කරනු ලැබිය ය යුතු ය.

පදනමේ මුද්‍රාව.

**13.** පදනමේ මුද්‍රාව පදනමේ සාමාජිකයන් දෙදෙනෙකු ඉදිරිපිට දී හැර කවර වූ හෝ සාධන පත්‍රයකට නොතැබිය යුතු අතර, එකී තැනැත්තන් තමන් පැමිණ සිටින බවට සලකුණක් වශයෙන් එකී සාධන පත්‍රයෙහි තම නම අත්සන් කළ යුතු ය. තව ද, එම අත්සන් කිරීම සාක්ෂිකරුවකු වශයෙන් යම් තැනැත්තකුගේ අත්සන් කිරීමට පරිබාහිරව විය යුතු ය.

ජනරජයේ සහ අන්‍යයන්ගේ අයිතිවාසිකම් ආරක්ෂා කිරීම.

**14.** මේ පනතේ සඳහන් තැනැත්තන්ගේ හා ඔවුන් විසින් ඔවුන් යටතේ හිමිකම්පාන තැනැත්තන්ගේ අයිතිවාසිකම්වලට හැර ජනරජයේ හෝ යම් රාජ්‍ය මණ්ඩලයක හෝ සංස්ථාවක හෝ වෙනත් යම් තැනැත්තකුගේ අයිතිවාසිකම්වලට මේ පනතේ ඇතුළත් කිසිවකින් හානියක් හෝ බලපෑමක් නොවිය යුතු ය.

අනනුකූලතාවක් ඇති වූ විට සිංහල භාෂා පාඨය බලපැවැත්විය යුතු බව.

**15.** මෙම පනතේ සිංහල සහ දෙමළ භාෂා පාඨ අතර යම් අනනුකූලතාවක් ඇතිවුවහොත්, එවිට, සිංහල භාෂා පාඨය බලපැවැත්විය යුතු ය.

පාර්ලිමේන්තුවේ සිංහල පනත් කෙටුම්පත්වල සහ පනත්වල වාර්ෂික දායක මිළ (දේශීය) රු. 870 කි. (විදේශීය) රු. 1,160 කි. අංක 163, කිරුළපන මාවත, පොල්හේන්ගොඩ, කොළඹ 05, රජයේ ප්‍රවෘත්ති දෙපාර්තමේන්තුවේ, ප්‍රකාශන කාර්යාංශයේ අධිකාරි වෙත සෑම වර්ෂයකම දෙසැම්බර් මස 15 වැනි දිනට පෙර දායක මුදල් ගෙවා පසුව එළඹෙන එක් එක් වර්ෂය සඳහා ඒවා ලබාගත හැකිය.